නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடிசெத்சிரிபாயபத்தரமுல்ல
4floor, Sethsiripaya, Battaramulla

මගේ අංකය / எனது இல / My No } DDD/HO/MF/05/01/සෙඩ

ඔබේ අංකය / உமது இல / Your No } ..............................

දිනය / திகதி / Date } 2015.06. ...

සියළුම දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරුවන්,

දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් වෙත,

**<u>දිවිනැගුම ප්‍රජා මූල බැංකු සඳහා අතිරේක පරිගණක පුහුණු ලාභියෙකුගේ සේවය ලබා ගැනීම හා සහනාධාර අරමුදල් ගෙවීම් කිරීම සඳහා කලාප සහකාරගේ සේවය ලබා ගැනීමට අවසර දීම.</u>**

**01.** දැනටමත්, දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති සඳහා රජයේ හෝ රජයට අනුබද්ධ ආයතනයක සාර්ථකව පරිගණක පාඨමාලාවක් හදාරා අවසන් කර ඇති ආධුනික පරිගණක පුහුණු ලාභියෙකුගේ සේවය ලබා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

නමුත් දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල සේවා කටයුතු පුළුල් වීම ,විවධ වූ කළමණාකරණ තීරණ ගැනීමට අවශ්‍ය වන්නාවූ වාර්තා සකස් කිරීම ,දිවිනැගුම ප්‍රජා මූල බැංකු සඳහා හඳුන්වා දීමට නියමිත පරිගණක මෘදුකාංගයේ මූලික දත්ත ඇතුලත් කිරීම ,සහනාධාර මුදල් කඩිනමින් බැර කිරීම වැනි අවශ්‍යතා මත හා බැංකුවල සේවක පුරප්පාඩු පැවතීම හේතුවෙන් තව දුරටත් පරිගණක පුහුණුලාභියෙකුගේ අවශ්‍යතා මතු වී ඇති බව නිරීක්ෂණ වී ඇත.

එබැවින් , දිවිනැගුම ප්‍රජා මූල බැංකු සඳහා පමණක් දැනට බඳවාගත් පුහුණු ලාභියාට අමතර තවත් පුහුණු ලාභියෙකුගේ සේවය ලබා ගැනීමට අනුමැතිය ලබා දෙන්නෙමු.මෙම පුහුණු ලාභීන්ගේ පුහුණු වීම් කාලය මාස 06ක් විය යුතු අතර,සතියක සේවා බිණ්ඩනයකින් පසු නැවත පුහුණු වීම් සඳහා අවසර දිය හැකිය. කෙසේ වෙතත් එම පත්වීම දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කිසිඳු ස්ථිර තනතුරකට ඉල්ලුම් කිරීමට හිමිකමක් නොවන බව ලිපියේ සඳහන් කල යුතුය. පුහුණුලාභියාට දෙනු ලබන ලිපියේ ආකෘතියක් මේ සමඟ අමුණා ඇත.

මෙම පුහුණුලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 12/2000 (iv) හි උපදෙස් පරිදි,දෛනික දීමනාව බැංකු අරමුදලින් ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය. බැංකු කළමණාකරුගේ සෘජු අධීක්ෂණය යටතේ මෙම නිලධාරීන් කාර්යයන්වල යෙදවිය යුතු අතර නැවත අනුමැතිය සඳහා ප්‍රජා මූල බැංකු අංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් නොකල යුතුය.

**02**. එසේම ප්‍රජා මූල බැංකු මගින් දිවිනැගුම සහනාධාර මුදල් ගිණුම්ගත කිරීම හා අදාල මුදල් ගෙවීම් කිරීමේ දී කඩිනමින් හා තදබදයකින් තොරව ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබා දීමට බැංකු කළමණාකරුවන් විසින් කලාප සහකාරගේ සේවය අත්‍යාවශ්‍ය දිනවල පමණක් ලබා ගැනීමට කටයුතු කල යුතුය. එම නිලධාරියාගේ සේවය ප්‍රමාණවත් නොවන්නේ නම් වසම් භාර සේවය කරන දිවිනැගුම සංවර්ධන නිලධාරීන් කිහිප දෙනෙකුගේ සේවය ලබා ගැනීමට හැකියාව ඇත. මෙම නිලධාරීන් සතියේ දිනවල රාජකාරී වේලාවෙන් පසුව රාජකාරීවල නිරත වන්නේ නම් ඒ සඳහා අතිකාල දීමනාද ,සතිඅන්ත හා රජයේ නිවාඩු දිනවල සේවය සඳහා යොදාගන්නා අවස්ථාවලදී අපගේ මෙහෙයුම් උපදෙස් පරිදි දින වැටුප් හා අතිකාල/අතට පාඩු ලැබීමට හිමිකම් ඇති බව තව දුරටත් දන්වා සිටිමි.

ඩී.ඒ.සුනන්දා පියසීලි,
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)

ධම්මික ගුණවර්ධන
අධ්‍යක්ෂක ජනරාල් (වැ.බ.)

පිටපත් :-1. ලේකම් , නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය - කා.දැ.ස.
2. සියළුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
3. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස.

# අනුමතියකි

පුහුණුලාභියාගේ නම හා ලිපිනය

………………………………..

……………………………….

**<u>දිවිනැගුම ප්‍රජා මූල බැංකු / දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති සඳහා</u>**

**<u>පරිගණක පුහුණු ලාභියෙකු ලෙස අනුයුක්ත කිරීම</u>**

.......................... දිවිනැගුම ප්‍රජා මූල බැංකුව/දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතියේ 20.................. දින සිට ....................... දක්වා මාස 06 ක් සඳහා පරිගණක පුහුණු වන්නෙකු ලෙස ඔබ අනුයුක්ත කර ඇති බව දන්වමි.

පුහුණු කාලය තුල,ආයතනික විනය ආරක්ෂා වන පරිදිත්,ආයතනික රෙගුලාසි / විධාන පරිදි පුහුණු කාලය තුල ඔබගේ කාර්යයන් ඉටු කල යුතු බව දන්වමි.

අප ආයතනයට අවශ්‍ය පරිදි පෙර දැනුම් දීමකින් තොරව ඔබගේ පුහුණු කාලය අඩු කිරීම හෝ අවසන් කිරීමට අයිතිය ඇති බව දන්වන අතර, තවද මෙම පුහුණුව රජයේ ස්ථිර හෝ ස්ථිර නොවන සේවයෙකුට හිමිවන වරප්‍රසාදයන් සඳහා හිමි අයිතිවාසිකමක් නොවන අතර, ඒ සඳහා ඉල්ලීම් කිරීමක් නොකරන බවත් එකඟ විය යුතුය.

රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 12 / 2000 හා 12/2000 (iv) හි සඳහන් උපදෙස් තව දුරටත් මෙම පුහුණුව සඳහා බලාත්මක වන බවද දන්වා සිටිමි.

……………………..

කළමණාකරු,